*සැ. යු.*- (i) 2013.06.07 දින පළවූ අංක 1814 දරන ගැසට් පත්‍රයේ I:III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,815 - 2013 ජුනි මස 14 වැනි සිකුරාදා - 2013.06.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1538 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1545 |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1552 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1554 |

*සැ. යු.*- (i) ආචාර්ය මාලිනී ෆොන්සේකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2011 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) තොරතුරු ලබා ගැනීමේ නිදහස පනත් කෙටුම්පත, 2011 මැයි මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* **පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජුලි මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජුනි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු — ඇබෑර්තු

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සුදුසුකම් සපුරා ඇති ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 01 | රියදුරු III | 02 | (6/2006 (iv) රා.ප.චලේ. අනුව) පීඑල් 3/2006ඒ රු. 12,470 - 10 x 130 - 10 x145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br><br>අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයක්වත් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර)<br><br>ලොරි/ට්‍රැක්ටර්/ගිලන්රථ මෝටර් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතු ය. (බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අදාළ සහතිකය ලබා තිබිය යුතු ය.)<br><br>වාහන රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය.<br><br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.<br><br>අවම උස අඩි 5 කට වැඩි විය යුතු ය. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br><br>දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතු ය.<br><br>ලොරි/ට්‍රැක්ටර්/ගිලන්රථ මෝටර් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතු ය. (බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අදාළ සහතිකය ලබා තිබිය යුතු ය.)<br><br>වාහන රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය.<br><br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.<br><br>අවම උස අඩි 5 කට වැඩි විය යුතු ය. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. |
| 02 | කාර්යාල කාර්ය සහායක | 01 | (6/2006 (iv) රා.ප. චලේ. අනුව) පීඑල් 1/2006ඒ රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සා.පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් (2) වත් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර) |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 03 | සෞඛ්‍ය කම්කරු | 07 | 06/2006 (iv) රා. ප. චලේ. අනුව) පීඑල් 1/2006ඒ රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම. |
| 04 | විදුලි කාර්මික | 01 | 06/2006 (iv) රා.ප.ච. ලේ. අනුව) පීඑල් 2/2006 ඒ රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x170 - රු. 18,600 | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර)<br>රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ජාතික පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය (N. V. Q.) 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>පළාත් සභා රාජ්‍ය සේවයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතු ය.<br>රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ජාතික පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහිතකය (N. V. Q) 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම. |
| 05 | පුස්තකාල සහායක | 02 | 6/2006 (iv) රා.ප.ච. ලේ. අනුව) පීඑල් 1/2006ඒ රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160 - රු. 17,600 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර) |
| 06 | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | 06/2006 (iv) රා.ප.ච. ලේ. අනුව) පීඑල් 2/2006 ඒ රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 | අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සා. පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර) |
| 07 | ජල කම්කරු | 01 | 6/2006 (iv) රා.ප.ච. ලේ. අනුව) පීඑල් 1/2006 ඒ රු. 11,730 - 10 x 120 -10 x 130 - 10 x 145 - 12 x160 - රු. 17,600 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) |

*අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

1. අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.
2. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.
(දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාල නොවේ)
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඩුවම් ලැබූවකු නොවිය යුතු ය.
5. ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් ස්වේච්ඡාවෙන් සේවය කරනු ලබන සේවක/සේවිකාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ.

*සේවා කොන්දේසි :-*

1. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිත ය.
2. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
3. තෝරාගනු ලබන සේවක/සේවිකාවන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.
4. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසිවලට ද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවයේ හෝ රජයේ දෙපාර්තමේන්තුව හෝ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.
5. පත්වීම ලැබීමෙන් පසු අවුරුදු තුනක කාලයක දී ස්ථිර කිරීම සම්බන්ධයෙන් සළකා බැලේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :-* මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස් කර 2013.07.05 වැනි දිනට පෙර "ලේකම්, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව, ඉබ්බාගමුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවරේ අදාළ තනතුරේ නම සඳහන් කළ යුතු ය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍ර ද, අසම්පූර්ණ අයදුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පලාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කල පිටපත් එවිය යුතු වේ :

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පලපුරුද්ද පිළිබඳ සහතිකය (රියදුරු බලපත්‍රය)
   ශිල්පීය හා අර්ධශිල්පීය තනතුරු සඳහා,
4. හැඳුනුම්පත් පිටපතක්,
5. පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය,
6. රියදුරකු වශයෙන් වසර 03 කට වැඩි පළපුරුද්ද සම්බන්ධ සේවා සහතිකය/විදුලි කාර්මිකයකු වශයෙන් වසර 02 ක පළපුරුද්ද පිළිබඳ සේවා සහතිකය,
7. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.

*බඳවාගැනීමේ ක්‍රමය :-*

1. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා සහ වෘත්තීය ප්‍රවීණතාව තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දැක්වේ)
2. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ හෝ වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ආර්. එම්. ටී. කේ. රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ඉබ්බාගමුව.

2013 මැයි මස 17 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ........................................................ තනතුර සඳහා වූ අයදුම්පත්‍රය

1. මුලකුරු සමග නම :————————————.
   මුලකුරු වලින් හැඳින්වෙන නම් :————————————.
2. පෞද්ගලික ලිපිනය :-
3. උපන් දිනය : අවුරුද්ද:————————————.මාසය :————————————. දිනය:————————————.
   (අ) ......................................... දිනට වයස : අවුරුදු :————————————.මාස.:————————————.දින :————————————.
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————————————.
5. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද?:————————————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය:————————————.
7. විවාහක/අවිවාහක බව:————————————.
8. සමත්ව ඇති ඉහල විභාගය:————————————.
9. ශිල්පිය නිපුනතා:————————————.
10. වෘත්තීය සුදුසුකම්:————————————.
11. ඔබට උසාවියකින් දඬුවම් පවරා තිබේ ද?:————————————.
12. එසේ නම් දඬුවම් ස්වභාවය:————————————.
13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර:————————————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය ————————————.

06-191

## සංශෝධනයයි

### කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව

2013.05.10 දින *ගැසට් පත්‍රයේ* පලකරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු පහත සඳහන් ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

2013.05.10 දින *ගැසට් පත්‍රයේ* පල කරන ලද කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු දැන්වීම අනුව ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් නැවත මෙම *ගැසට්* නිවේදනය අනුව ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළයුතු බව මෙයින් දන්වමි. එසේම මෙම සුදුසුකම් නොමැතිව ඉදිරිපත් වී ඇති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| *අ.අ.* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| 01 | පුස්තකාල සහායක III | 06 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. |
| 02 | කාර්යාල කාර්ය සහායක II | 01 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. |
| 03 | මාර්ග කම්කරු III | 01 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. |
| 04 | රියදුරු II (අ) පන්තිය | 03 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහිතක පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. |
| 05 | විදුලි කාර්මික (III පංතිය) | 01 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. |
| 06 | ආදාහනාගාර ක්‍රියාකරු සහායක | 01 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදුසහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. |
| 07. | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. |

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය :- 2013.06.21 වේ.

එස්. කේ. එල්. වීරසේකර,
ලේකම්,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව,
මැනික්හින්න.

2013 ජුනි මස 04 වැනි දින,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව,
මැණික්හින්න.

06-246

## මොරටුව මහ නගර සභාව

මොරටුව මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු . අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර පරිපාලක | 06 | MN1-2006A | 13,120 - 10 x 145 - 11 x 170 10 x 240 - 10 x 320 - 22,040 | (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ගණිතය/වානිජ අංක ගණිතය/ ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම ;<br>හෝ<br>(ආ) ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය හා සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම ;<br>හෝ<br>(ඇ) පළාත් පාලන ආයතනයක අවුරුදු 10 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වැනි පන්තිය සමත් වී තිබීම; |
| 02 | ආයුර්වේද ඖෂධ සංයෝජක | 05 | PL2- 2006A | 12,210 - 10 x 130 - 10 x 145 10 x 160 - 12 x 170 - 18,600 | (I) ජ්‍යෙෂ්ඨ පාඨශාලා ඖෂධ සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම;<br>නැතහොත්<br>ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම;<br>සහ<br>II රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ පිළිගත් රජයේ ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක කිසියම් තනතුරක වසරකට නොඅඩු කාලයක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |

| *අනු . අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 03 | පින්තාරුකරු III ශ්‍රේණිය (අර්ධ ශිල්පීය) | 02 | PL2- 2006A | රු.12,210 - 10 x 130 - 10 x 145 10 x 160 - 12 x 170 - රු.18,600 | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>*(අ)* අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම ;<br>*සහ*<br>*(ආ)* තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)<br>*බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>*(අ)* ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, කුමන හෝ විෂයයන් දෙකක් සමත්වී තිබීම ;<br>*සහ*<br>*(ආ)* තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම, (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.) |
| 04 | ආදාහනාගාර ක්‍රියාකරු (III ශ්‍රේණිය) අර්ධ ශිල්පීය) | 01 | PL2-2006A | රු.12,210 - 10 x 130 - 10 x 145 10 x 160 - 12 x 170 - රු.18,600 | *1. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා*<br>(අ) අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම;<br>*සහ*<br>*(ආ)* මෙම තනතුරට අදාලව අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයන් ඉදිරිපත් කළ යුතු ය.<br>*බාහිර අයදුම්කරුවන් සඳහා*<br>*(අ)* ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, කුමන හෝ විෂයයන් දෙකක් සමත් වී තිබීම ;<br>*සහ*<br>*(ආ)* තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතන යක සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. |

*බඳවා ගැනීමේ කොන්දේසි* :-

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
(2) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
(3) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට වයස් සීමාව බලනොපානු ඇත.)
(4) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(5) සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
(6) වැඩ ක්ෂේත්‍ර පරිපාලක තනතුර සඳහා පමණක් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ප්‍රකාර ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 1.30 ප්‍රශ්න පත්‍රයක් හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කරන පැය 1 ක ප්‍රශ්න පත්‍රයකි.
(7) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු හෝ දඩුවම් ලැබුවකු නොවිය යුතුය.
(8) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.
(9) මොරටුව මහ නගර සභා සීමාව තුළ පදිංචි හා දැනට මොරටුව නගර සභාවේ සේවයේ නියුක්ත ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත හෝ ව්‍යාපෘතියක් යටතේ සේවයේ යෙදී සිටින සේවකයින් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(2) ස්ථිර පත්වීම අවු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
(3) මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා බස්නාහිර පළාත් සභාව වරින් වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

*අයදුම්පත් එවිය යුතු ආකාරය* :

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු අතර අයදුම්පත් 2013.07.14 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් පමණක් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

2. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

* උප්පැන්න සහතිකය ;
* අධ්‍යාපන සහතිකය;
* ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහිතකය;
* මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්;
(එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුය.)

එස්. කේ. ජයසුන්දර,
නාගරික කොමසාරිස් (රා. ඉ.)
මොරටුව මහ නගර සභාව.

2013 මැයි මස 28 වැනි දින,
මොරටුව මහ නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහ නගර සභාවේ ....................................... තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. මුලකුරු සමග නම :——————————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————————.
3. ස්ථිර ලිපිනය:——————————————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය:——————————————.
6. උපන් දිනය : අවුරුද්ද :——————————————.මාසය:——————————————. දිනය:——————————————.

7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු:——————. මාස:——————. දින:—————.
8. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
9. විවාහක/අවිවාහක බව:——————————.
10. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද?:——————————.
11. අධ්‍යාපන සුදුසුකම්:——————————.
12. වෙනත් සුදුසුකම්:——————————.
13. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඒ පිළිබඳ විස්තර
    (i) දැනට දරන තනතුර:——————————.
    (ii) ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ද යන වග?:——————————.
    (iii) එම තනතුරට පත් වූ දිනය:——————————.
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද?:——————————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම ඉල්ලුම්කරු/කාරිය වන................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ.......................................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:——————————,
තනතුර:——————————,
නිල මුද්‍රාව :——————————.

06-253

---

# පළාත් පාලන නිවේදන

## වැලිගම ප්‍රාදේශීය සභාවේ දියුණුකල ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම හා වරිපනම් ප්‍රදේශය දීර්ඝ කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් 2012.10.25 වැනි දින වැලිගම ප්‍රාදේශීය සභාවේ මාසික සභා වාර්තාවේ යෝජනා අංක 06.01.03 පරිදි පහත සඳහන් ප්‍රදේශ 1987 අංක 15 දරන ප්‍රදේශයේ සභා පනතේ 134 (01) යටතේ දියුණුකල ප්‍රදේශ ලෙස නම් කිරීම පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අංක මාර/සංස2/බදු හා බල/වැ ප්‍රා හා 2013.02.08 වැනි දින ලිපිය පරිදි ප්‍රකාශයට පත් කිරීම අනුමත කර ඇති බැවි සියලු දෙනාගේ දැන ගැනීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. කඹුරුගමුව කොටවිල මාර්ගයේ පිහිටි සියලු අතුරු මාර්ගවල දෙපස පිහිටි දේපළ වම සහ දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂය කර ගෙන මීටර් 100.
2. මිදිගම නාකන්ද මාර්ගයේ පිහිටි සියලු අතුරු මාර්ගවල දෙපස පිහිටි වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කර ගෙන මීටර් 100.
3. උඩුපිල කඹුරුගමුව මාර්ගයේ පිහිටි සියලු අතුරු මාර්ගවල දෙපස පිහිටි දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කර ගෙන මීටර් 100.
4. මුදුගමුව ජඹුරේගොඩ මාර්ගයේ පිහිටි සියලු අතුරු මාර්ගවල දෙපස පිහිටි දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කර ගෙන මීටර් 100.
5. මුදුගමුව සිට වැලිගම මාර්ගයේ පිහිටි සියලු අතුරු මාර්ගවල දෙපස පිහිටි දේපල වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කර ගෙන මීටර් 100.
6. වැලිපිටිය හිලිය සිට කනංකෙ මාර්ගයේ පිහිටි සියලු අතුරු මාර්ගවල දෙපස පිහිටි දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කර ගෙන මීටර් 100.
7. වැලිපිටිය හිදිය සිට කොලේදණ්ඩ මාර්ගයේ පිහිටි සියලු අතුරු මාර්ගවල දෙපස පිහිටි දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කර ගෙන මීටර් 100.

8. දෙනිපිටිය හංදිය සිට කොළේදණ්ඩ මාර්ගයේ පිහිටි සියලු අතුරුමාර්ගවල දෙපස පිහිටි දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කරගෙන මීටර් 100.
9. මිදිගම හංදිය සිට ඔරියන්ට් ගාර්මන්ට් දක්වා මාර්ගයේ පිහිටි සියලු අතුරු මාර්ගවල දෙපස පිහිටි දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කරගෙන මීටර් 100.
10. මිරිස්සේ සිට වරාය දක්වා ඇති සියලු අතුරු මාර්ගවල දෙපස පිහිටි දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කරගෙන මීටර් 100.
11. වැලිගම අකුරැස්ස මාර්ගයේ පිහිටි සියලු අතුරු මාර්ගවල දෙපස පිහිටි දේපළ වම හා දකුණ වශයෙන් එම පාර මධ්‍ය ලක්ෂ්‍ය කරගෙන මීටර් 100.

ඉහත ප්‍රදේශවලට අමතරව සහා බල ප්‍රදේශයේ වෙන්දේසි කරන ලද ඉඩම් වරිපනම් ප්‍රදේශ ලෙස නම් කිරීමත් බල ප්‍රදේශයේ දුරකථන කුළුණු සවිකර ඇති ප්‍රදේශ වරිපනම් බදු සීමාවට ඇතුළත් කර වරිපනම් බදු අය කිරීමටත්.

පුෂ්පකුමාර බැටවිටගේ,
සභාපති,
වැලිගම ප්‍රාදේශීය සභාව.

2013 මැයි මස 29 වැනි දින,

06-321

---

**බණ්ඩාරවෙල මහා නගර සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව)

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා සාදනු ලැබ 1989.01.20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 541/17 දරන අතිවිශේෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක I සිට LVII දක්වා වූ සියලුම අතුරු ව්‍යවස්ථා බණ්ඩාරවෙල මහා නගර සභාව වෙනුවෙන් ද පිළිගැනීම සුදුසු යැයි 2011.08.04 දින පැවති බණ්ඩාරවෙල මහා නගර සභා රැස්වීමේ දී සභා සම්මත වූ බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
බණ්ඩාරවෙල.

2011 අගෝස්තු මස 04 වැනි දින,
බණ්ඩාරවෙල මහ නගර සභාව.

06-198

---

**අරණායක ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24 (2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ කෑගලු දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත/ මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත/මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට තුන් මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. දිනේෂ් ගුණරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2013 මැයි මස 21 වැනි දින,
අරණායාක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | දෙබත්ගම ජනපද පඩිපෙල මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | : | දෙබත්ගම කෑගල්ල මාර්ගයේ 4 කණුව අසලින් ආරම්භ වී බෝධිය අසලින් අවසන් වේ. |
| ග්‍රාමසේවා වසම හා අංකය | : | 47 එෆ් කුමාරපුර |
| මාර්ගයේ දිග හා පළල | : | මීටර් 750, අඩි 08 |

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :*

1. බී. ඒ. රෙජිත් බාලසූරිය මයා - නයිනන්කඩ මූකලාන
2. එච්. පී. ගුණතිලක මයා - නයිනන්කඩ මූකලාන
3. ඩබ්. පී. සිරිල් වික්‍රමසිංහ මයා - නයිනන්කඩ මූකලාන
4. ඒ. ඩී. මාලනී මිය - ගලඋඩ හේන
5. එම්. පී. නිල්මිණී උදය බංඩාර මයා - ආරාමේ ඉඩම

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :*

1. එච්. පී. ගුණතිලක මයා - නයිනන්කඩ මූකලාන
2. එච්. පී. තුසිත උපුල් කුමාර මයා - නයිනන්කඩ මූකලාන
3. එච්. පී. රුවන් කුමාර මයා - නයිනන්කඩ මූකලාන
4. එච්. පී. සොමතිලක මයා - නයිනන්කඩ මූකලාන
5. එස්. පී. ගුණතිලක මයා - අංක 8244 ඉඩම.

| | |
|---|---|
| මාර්ගයේ නම | : බෝධිරාජ මාවත (හදබිම උඩගම ගංතුන) |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | : අරණායක ගංතුන ප්‍රධාන<br>මාර්ගයේ පාලිත කුමාර මහතාගේ ඉඩම අසල සිට සමන්ත මහතාගේ ඉඩම දක්වා. |
| ග්‍රාම නිළධාරි වසම | : 58ජී ගංතුන මැදගම |
| මාර්ගයේ දිග සහා පළල | : මීටර් 600, අඩි 8 |

*මාර්ගයේ ආරම්භය සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :*

01. පාලිත කුමාර මයා - 3101/B/03 ඉඩම
02. තිලක් සිසිර කුමාර මයා - 3101/ B/04 ඉඩම
03. ජී. කේ. ගුණරත්න මයා - 3101/ B/05 ඉඩම
04. අයි. එන්. ජොන් මයා - 3101/ B/06 ඉඩම
05. ඩබ්ලිව්. ජයසේන මයා - 3101/ B/10 ඉඩම
06. එච්. පී. ගුණදාස මයා - 3101/B/12 ඉඩම
07. එස්. එච්. පුංචි නෝනා මිය - 3101/B/15 ඉඩම
08. කේ. වීරසූරිය මයා - 3101/ B/16 ඉඩම

*මාර්ගයේ ආරම්භය සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :*

01. පාලිත කුමාර මයා - 3101/ B /03 ඉඩම
02. එම්. එච්. සුගතපාල මයා - 4444/05 ඉඩම
03. කේ. සරත් ජයතිස්ස මයා - 4444 /01 ඉඩම
04. එම්. ජී. තිලකරත්න මයා - 3101/B/07 ඉඩම
05. එම්. ජී. ජස්ටින් පෙරේරා මයා - 3101/ B/08 ඉඩම
06. වී. සුසන්ත කුමාර මයා - 3101/ B/09 ඉඩම
07. එම්. ජී. සිරිවර්ධන මයා - 1268/01 ඉඩම

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | බැලුන්ගල මාර්ගයේ සිට කොඩිගල දක්වා මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | : | හුලංකපොල්ල බැලුන්ගල මාර්ගයේ<br>රෝහන මහතාගේ නිවස අසල සිට කොඩිගල දක්වා මාර්ගය |
| ග්‍රාම සේවා වසම හා අංකය | : | 58 එෆ් නාරංගල |
| මාර්ගයේ දිග හා පළල | : | මීටර් 800, අඩි 8 |

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :*

1. එච්. ඒ. රෝහන හතුරුසිංහ මයා - නාරංගල උඩපීනල් වත්ත
2. කේ. එච්. දිනේෂ් කීර්ති කුමාරසිංහ මයා - නාරංගල උඩපීනල් වත්ත
3. ජී. කේ. ගුණරත්න මයා - නාරංගල උඩපීනල් වත්ත
4. ආර්. ටී. ඒ. අබේරත්න මයා - නාරංගල උඩපීනල් වත්ත
5. එස්. ජයමූර්ති මයා - අංක 180/32 දරන ඉඩම
6. අලගිසාමි ජයලෙච්චමි මිය - අංක 180/33 දරන ඉඩම
7. සී. භූමිනාදන් මයා - අංක 180/29 දරන ඉඩම

| | | | |
|---|---|---|---|
| 8. | ටී. ඩී. සෙනවිරත්න මයා | - | නාරංගල උඩපීනල් වත්ත |
| 9. | පී.පී. උපාලි නන්දන මයා | - | නාරංගල උඩපීනල් වත්ත |
| 10. | තරංග ගුණතිලක මයා | - | නාරංගල උඩපීනල් වත්ත |
| 11. | ඩබ්ලිව්. ජී. රුවන් පුෂ්ප කුමාර මයා | - | නාරංගල උඩපීනල් වත්ත |
| 12. | එම්. ජී. තිලකරත්න මයා | - | අංක 180/03 දරන ඉඩම |
| 13. | ආර්. පී. විජේකෝන් මයා | - | නාරංගල උඩපීනල් වත්ත |
| 14. | ආර්. පී. සෝමලතා මිය | - | නාරංගල උඩපීනල් වත්ත |
| 15. | ආර්. පී. ගුණවතී මිය | - | අංක 180/13 දරන ඉඩම |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

| | | | |
|---|---|---|---|
| 1. | එච්. ඒ. රෝහන හතුරුසිංහ මයා | - | නාරංගල උඩපීනල් වත්ත |
| 2. | ආර්. ටී. ඒ. අබේරත්න මයා | - | නාරංගල උඩපීනල් වත්ත |
| 3. | කේ. පී. ඩබ්ලිව්. එස්. කරුණාතිලක මයා | - | අංක 180/33 දරන ඉඩම |
| 4. | අලගිසාමි ජයලෙච්චමි මිය | - | අංක 180/33 දරන ඉඩම |
| 5. | සී. භූමිනාදන් මයා | - | අංක 180/29 දරන ඉඩම |
| 6. | ටී. ඩී. සෙනවිරත්න මයා | - | නාරංගල උඩපීනල් වත්ත |
| 7. | පී. පී. උපාලි නන්දන මයා | - | නාරංගල උඩපීනල් වත්ත |
| 8. | එම්. පී. යමුනා සවර්ණ කාන්ති මිය | - | නාරංගල උඩපීනල් වත්ත |
| 9. | තරංග ගුණතිලක මයා | - | නාරංගල උඩපීනල් වත්ත |
| 10. | ඩබ්ලිව්. ජී. රුවන් පුෂ්ප කුමාර මයා | - | නාරංගල උඩපීනල් වත්ත |
| 11. | එම්. ජී. තිලකරත්න මයා | - | අංක 180/03 දරන ඉඩම |
| 12. | ආර්. පී. විජේකෝන් මයා | - | නාරංගල උඩපීනල් වත්ත |
| 13. | ආර්. පී. සෝමලතා මිය | - | නාරංගල උඩපීනල් වත්ත |
| 14. | ආර්. පී. විජේතුංග මයා | - | නාරංගල උඩපීනල් වත්ත |

මාර්ගයේ නම : කොහුඅඹේගොඩ මාර්ගය
මාර්ගයේ ආරම්භය සහ අවසානය : හොරේ වල සැලව මාර්ගයේ වලල්හා උඩතැන්න මාර්ගයේ සිට අරම ලිඳපිටිය වෙල්යාය දක්වා
ග්‍රාම සේවා වසම හා අංකය : රහල බටහිර
මාර්ගයේ දිග හා පළල : මීටර් 450, අඩි 05

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. එල්. පී. සුගතපාල මයා - උඩතැන්නවත්ත ඉඩම

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. ඩබ්ලිව්. කුලරත්න මයා - පල්ලේවත්ත ඉඩම
2. ඩබ්ලිව්. විජේපාල මයා- - උඩතැන්නවත්ත ඉඩම

මාර්ගයේ නම : හකුරුගම්මන ඕවත්ත මාර්ගය
මාර්ගයේ ආරම්භය සහ අවසානය : හකුරුගම්මන ඕවත්ත මාර්ගයේ ගලහිටියාව කුඹුර අසලින් ආරම්භ වී ඕවත්ත ඉඩමෙන් අවසන් වේ.
ග්‍රාම සේවා වසම හා අංකය : 42 හකුරුගම්මන
මාර්ගයේ දිග හා පළල : මීටර් 800, අඩි 8

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

| | | | |
|---|---|---|---|
| 1. | එම්. ගුණතිලක මයා | - | පාලුවත්ත ඉඩම |
| 2. | ඕ. ජී. කරුණාරත්න මයා | - | ඕවත්ත ඉඩම |
| 3. | ඕ. ජී. ආරියරත්න මයා | - | ඕවත්ත ඉඩම |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

| | | | |
|---|---|---|---|
| 1. | එම්. උබේසේන බංඩා මයා | - | හරංකහමුලවත්ත ඉඩම |
| 2. | එම්. සේනානායක බංඩා මයා | - | හිටිනාවත්ත ඉඩම |
| 3. | එම්. ඒකනායක මයා | - | හිටිනාවත්ත ඉඩම |
| 4. | කේ. ඩී. ගාමිණී ජයරත්න මයා | - | ඕවත්ත ඉඩම |
| 5. | ඕ. ජී. ඩිංගිරි මිය | - | ඕවත්ත ඉඩම |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | පරපිටිය ජනපදයේ ක්‍රීඩාපිටිය අසල සිට ඉහළට යන මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | : | පරපිටිය ජනපදයේ ක්‍රීඩාපිටිය අසල සිට ධර්මදාස මහතාගේ නිවස දක්වා |
| ග්‍රාම සේවා වසම හා අංකය | : | 47ඒ දේබත්ගම, පල්ලේබගේ |
| මාර්ගයේ දිග හා පළල | : | මීටර් 500, අඩි 8 |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. වී. අරුණ ප්‍රදීප් කුමාර මයා - බඩල්තැන්න ඉඩම
2. එස්. පී. ධර්මදාස මයා - බඩල්තැන්න ඉඩම
3. බී. ඒ. ඩබ්ලිව්. ෂෙල්ටන් කුරේ මයා - බඩල්තැන්න ඉඩම
4. එස්. පී. ධර්මදාස මයා - බඩල්තැන්න ඉඩම

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. අයි. පී. සුනිල් මයා - බඩල්තැන්න ඉඩම
2. පී. ආර්. එන්. බී. කේ. ජයකොඩි මයා - තෙල්දෙණිය කුඹුර
3. බී එස්. ජගත් රොෂාන් කුරේ මයා - බඩල්තැන්න කුඹුර
4. නිමල් ගුණරත්න මයා - බඩල්තැන්න ඉඩම

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | වත්තේගෙදර හපුගහතැන්න වත්ත හින්නේකුඹුර හේන මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | : | වත්තේගෙදර හපුගහතැන්න වත්ත සිට හින්නේකුඹුර හේන දක්වා මාර්ගය |
| ග්‍රාම නිලධාරි වසම | : | 16 ජී වත්තේගෙදර |
| මාර්ගයේ දිග සහ පළල | : | මීටර් 725, අඩි 10 |

මාර්ගයේ ආරම්භය සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

01. කේ. ආර්. රන්බණ්ඩා මයා - හපුගහතැන්න වත්ත ඉඩම
02. කේ. ආර්. සුමනාවතී මිය - හපුගහතැන්න වත්ත ඉඩම
03. කේ. ආර්. ලොකුමැණිකේ මිය - හපුගහතැන්න වත්ත ඉඩම
04. කේ. ආර් පුංචි අප්පුහාමි මයාB - හපුගහතැන්න වත්ත ඉඩම
05. කේ. ආර්. නිහාල් අනුර කුමාර මයා - හීන්නේකුඹුර හේන ඉඩම

මාර්ගයේ ආරම්භය සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

01. කේ. ආර්. පුංචිබණ්ඩා මයා - හපුගහමුල හේන ඉඩම
02. එස්. ඒ. සරත් දසනායක මයා - හීන්නේකුඹුර හේන ඉඩම
03. කේ. ආර්. සරත් දිසානායක මයා - හීන්නේකුඹුර හේන ඉඩම

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | හබලක්කාව ශ්‍රී ජයසුමනාරාම මාවතේ සිට උඩහේන දක්වා මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | : | හබලක්කාව ශ්‍රී ජයසුමනාරාම මාවතේ සිට උඩහේන දක්වා මාර්ගය |
| ග්‍රාම නිලධාරි වසම | : | 44ඒ හබලක්කාව |
| මාර්ගයේ දිග සහ පළල | : | මීටර් 500, අඩි 8 |

මාර්ගයේ ආරම්භය සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

01. ඒ. ඩබ්. ජී. එම්. ඩී. සොපයා මිය - හේන ඉඩම
02. ඩබ්. ජී. එස්. සුනන්ද මයා - හේන ඉඩම

මාර්ගයේ ආරම්භය සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

01. ඒ. ඩබ්. ජී. එම්. ඩී. සොපයා මිය - හේන ඉඩම
02. යූ. ඩී. එස්. චන්ද්‍රකාන්ති මිය - කොපිලන්ද ඉඩම
03. එස්. ඩී. සීලවතී මිය - කොපිලන්ද ඉඩම

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | වැවල සිට පන්සල සිට උඩගහවත්ත දක්වා මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | : | වැවල පන්සල අසලින් ආරම්භ වී උඩගහවත්ත ඉඩමෙන් අවසන් වේ |
| ග්‍රාම සේවා වසම හා අංකය | : | 42 බී පන්නල |
| මාර්ගයේ දිග සහ පළල | : | මීටර් 800, අඩි 8 |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

| | | | |
|---|---|---|---|
| 01. | ධම්මධජ හිමි | - | විහාර භූමිය ඉඩම |
| 02. | ඩී. ජී. නන්දන ජයතිස්ස මයා | - | වැවල හේන ඉඩම |
| 03. | එස්. ඩී. රණවීර මයා | - | ලැසනෑ කොටුව ඉඩම |
| 04. | ඒ. ඩබ්ලිව්. ජයනන්ද මයා | - | උඩගහවත්ත ඉඩම |
| 05. | ඩබ්ලිව්. පුෂ්පලතා මිය | - | උඩගහවත්ත ඉඩම |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

| | | | |
|---|---|---|---|
| 01. | ජී. ඩී. ජයන්ත නිශ්සන්ක මයා | - | වැවල හේන ඉඩම |
| 02. | පී. එල්. ජයවර්ධන මයා | - | හාලිඇල ඉඩම |
| 03. | ඩී. ජී. නන්දන ජයතිස්ස මයා | - | හාලිඇල ඉඩම |
| 04. | කේ. ඩී. සේනාධීර මයා | - | අම්බලන්පිටිය ලියද්ද |
| 05. | ඒ. ඩබ්ලිව් බේබි මිය | - | හාලිඇල ඉඩම |
| 06. | පී. එල්. කරුණාතිලක මයා | - | හාලිඇල ඉඩම |
| 07. | එල්. කරුණා ලතා මිය | - | හාලිඇල ඉඩම |
| 08. | පී. එල්. කරුණාතිලක මයා | - | හාලිඇල ඉඩම |
| 09. | පී. එල්. ආරියසිංහ මයා | - | හාලිඇල ඉඩම |
| 10. | සෝරත හිමි | - | කිරිවනා ඉඩම |
| 11. | ඒ. ඩබ්ලිව්. පියදාස මයා | - | නිකමුල්ලේ ඉඩම |
| 12. | ඒ. ඩබ්ලිව්. උපාලි සමරවික්‍රම මයා | - | උඩගහවත්ත ඉඩම |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | වැලිමන්න පිංකනටිය කුඹුර හරහා උඩහාවත්ත මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | : | වැලිමන්න පිංකනටිය කුඹුරෙන් ආරම්භවී මූනමල්ගහවත්ත ඉඩමෙන් අවසන්වන මාර්ගය |
| ග්‍රාම නිළධාරි වසම | : | 43 ගැටබේරිකන්ද |
| මාර්ගයේ දිග හා පළල | : | මීටර් 213 අඩි 08 |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

| | | | |
|---|---|---|---|
| 1. | බී. පඤ්ඤාලෝක හිමි | - | පිංකනටිය කුඹුර |
| 2. | කේ. ජී. අබේරත්න මයා | - | අස්සැද්දුම කුඹුර |
| 3. | එච්. ජී. ඒ. ආර්. හීංවැල්ල මයා | - | අස්සැද්දුම කුඹුර |
| 4. | එච්. වී. ගුණවර්ධන මයා | - | එගොඩහවත්ත |
| 5. | එච්. වී. ජයවර්ධන මයා | - | එගොඩහවත්ත |
| 6. | යූ. ජී. වික්‍රමසිංහ මයා | - | කුරහන්කොටුව |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

| | | | |
|---|---|---|---|
| 1. | බී. පඤ්ඤාලෝක හිමි | - | හැවැන්දෙනිය කුඹුර |
| 2. | එන්. සමරපාල මයා | - | එගොඩහවත්ත |
| 3. | එච්. වී. ගුණවර්ධන මයා | - | එගොඩහවත්ත |
| 4. | එච්. වී. ජයවර්ධන මයා | - | එගොඩහවත්ත |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | දෙලහිටියාව කනත්ත අසලින් සහීර් මහතාගේ නිවස අසලින් දෙලහිටියාව අතුරු මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | : | දෙලහිටියාව කනත්ත අසල සිට සහීර් මහතාගේ නිවස දක්වා |
| ග්‍රාමසේවා වසම හා අංකය | : | 45/බී ගැවිලිපිටිය නගරය |
| මාර්ගයේ දිග හා පළල | : | මීටර් 25, අඩි 08 |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

කුඹුරේ පිල්ලෑව

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

| | | | |
|---|---|---|---|
| 1. | බී. ඩී. සී. අයිරංගනී ප්‍රනාන්දු මිය | - | R7246ඉඩම |
| 2. | ඒ. ඩබ්ලිව්. තිලකරත්න මයා | - | R 7245 ඉඩම |
| 3. | ඩබ්ලිව්. ඒ. අනුලාවතී මිය | - | R 7244 ඉඩම |
| 4. | ටී. ඩී. උදේසිරි මයා | - | R 7243 ඉඩම |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | ගම්මන්නාගොඩ සිට අමුහේන දක්වා මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | : | මාවනැල්ල ඇරව්පොල මාර්ගයේ සිට හිරුවල් අඹේහේන දක්වා මාර්ගය |
| ග්‍රාමසේවා වසම හා අංකය | : | 17සී ගම්මන්නාගොඩ |
| මාර්ගයේ දිග හා පළල | : | මීටර් 243, අඩි 06 |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. ජී. පී. ජී. ආර්. ඩී. ජයරත්න මයා - සියඹලාඋල්ල කුඹුර
2. ජී. පී. ජී. ආර්. ඩී. ජයරත්න මයා - හිටිනාවත්ත ඉඩම
3. පී. වී. වසන්ත අමරසිංහ මයා - පහලවත්ත ඉඩම
4. පී. වී. ජයසේන මයා - තැන්නේවත්ත ඉඩම
5. පී. වී. පියදාස මයා - හිරුවල් අඹේහේන ඉඩම

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

1. පී. වී. ඇඩ්වින් මයා - සියඹලාඋල්ල කුඹුර
2. පී. වී. විජේසුන්දර මයා - පහලවත්ත ඉඩම
3. පී. වී. ජයසේන මයා - තැන්නේවත්ත ඉඩම
4. පී. වී. පියදාස මයා - හිරුවල් අඹේහේන ඉඩම

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | 3 කණුව සිට දොලමග දක්වා මාර්ගයේ ගුණවර්ධන මහතාගේ නිවස අසල සිට අහස්ලියද්ද දක්වා මාර්ගය |
| මාර්ගයේ ආරම්භය හා අවසානය | : | හාස්ලියද්ද ගමේ පිහිටි හැදෙනියවත්ත ඉඩමෙන් ආරම්භව අහස්ලියද්ද වත්ත දක්වා මාර්ගය |
| ග්‍රාම නිලධාරි වසම | : | වාකිරිගල |
| මාර්ගයේ දිග හා පළළ | : | මීටර් 516, අඩි 12 |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම් පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

01. එම්. ඩී. ජී. දසනායක මයා - හැදෙනියවත්ත
02. එම්. ඒ. ප්‍රසාද් වික්‍රමසිංහ මයා - හැදෙනියවත්ත
03. ඒ. සේතන් මයා - කලව්ගස්හින්නේ හේන
04. ආර්. ජානකී මංගිකා මිය - පන්සලේහේන
05. පූජ්‍ය දීවෙල චන්ද්‍රසිරි මිය - පන්සලේහේන
06. ජේ. සෝමතිලක මයා - වැලිකඩහේන
07. එම්. ජයසේන මයා - අහස්ලියද්ද වත්ත

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

01. එම්. ඩී. ජී. දසනායක මයා - හැදෙනියවත්ත
02. එම්. සිරිල් ගුණවර්ධන මයා - බෙල්ලනවත්ත
03. එම්. ඩී. ජී. දසනායක මයා - හැදෙනියවත්ත
04. කේ. චින්තා සමරසිංහ මිය - පන්සලේවත්ත
05. එම්. එම්. ආරියදාස මයා - කලව්ගස්හින්නේ හේන
06. කේ. චින්තා සමරසිංහ මිය - හැදෙනියවත්ත
07. කේ. ශ්‍රියානි මිය සහ ආර් සයිමන් මයා - පන්සලේහේන
08. පූජ්‍ය දීවෙල චන්ද්‍රසිරි හිමි - පන්සලේහේන
09. ජේ. සෝමතිලක මයා - වැලිකඩහේන
10. ජී. ජී. විමලසූරිය මයා - අහස්ලියද්ද වත්ත

06-242

# අතුරු ව්‍යවස්ථා

## සම්මත අතුරු ව්‍යවස්ථාව - කුරුවිට ප්‍රාදේශීය සභාව

261 වැනි අධිකාරය වන අංක 1952 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් 2013 පෙබරවාරි මස 19 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී පහත උපලේඛනයේ සඳහන් අංක 06-01-01 යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රේමරත්න මල්කැකුළ,
සභාපති,
කුරුවිට ප්‍රාදේශීය සභාව.

2013 මැයි මස 27 වැනි දින,
කුරුවිට සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

"1989 අංක 12 දරන පලාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන අංක 1952 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සබරගමුව පළාත් සභාවේ පාලත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සාදන ලැබ, 2011.01.28 දින හා අංක 1691 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පල කරන ලද, සබරගමුව පලාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බව 2012.03.30 දින හා අංක 1752 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පලකරන ලද්දා වූ සබරගමුව පලාතේ ප්‍රාදේශීය සභාවල මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම් පත් අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව ගැසට් පත්‍රයේ පල කරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට, ඉහත කී පලාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කුරුවිට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය".

කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා -

1. මෙම අතුරු ව්‍යවස්ථා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සහ විනාශ කිරීම මගින් බල ප්‍රදේශයේ පාරිසරික තත්වය වැඩිදියුණු කිරීම සහ බෝවන රෝග පැතිර යාම වැළැක්වීම සඳහා වූ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කුරුවිට ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු කිසියම් පරිශ්‍රයක මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් බෝවීමේ හා වර්ධනය වීමට තුඩු දෙන පරිදි කටයුතු කිරීම හෝ කරවීම හෝ එසේ වීමට ඉඩහැරීම හෝ නොකළ යුතුය.

3. මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සෑම පරිශ්‍රයකම පදිංචිකරුවෙකු විසින්ම,

   (i) සියලු නොවැසූ ටින්, බෝතල්, පෙට්ටි, ප්ලාස්ටික්, කෑන්, ටයර්, පොල් කටු, පොල් කෝම්බ සහ ඒ ස්ථානයේ ඇති වෙනත් යම් ජලය රඳා පැවතිය හැකි භාණ්ඩ, ද්‍රව්‍ය හා භාජන ආදිය ඉවත් කිරීමට හෝ විනාශ කර දැමීමට හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කළ යුතුය.
   (ii) නේවාසික හෝ නේවාසික නොවන ගොඩනැගිලිවල වැහි පීලි ජලය පහතට වැටෙන පයිප්ප සහ ගෙවතුවල ඇති කාණුවල ජලය බැසයාම ක්‍රමවත්ව පවත්වා ගෙන යා යුතුය. ඒවායේ අවහිරකම් නිරන්තරයෙන් පරීක්ෂා කර බලා ඉවත් කළ යුතුය.
   (iii) නේවාසික හෝ නේවාසික නොවන පරිශ්‍ර තුළ ඇති සියලුම, ජල බඳුන්, ටැංකි සහ ජලය එක්රැස් කරන වෙනත් භාජන මනා තත්තවයකින් යුතුව හා කාලීන ප්‍රතිසංස්කරණයන් සහිතව පවත්වාගෙන යාම ද ඒවා මදුරුවන්ගෙන් හා කෘමීන්ගෙන් ආරක්ෂා වන පරිදි වසා තැබීම හෝ ආවරණය කර තැබීමද, ඒවායේ මදුරුවන් හා කෘමීන් බෝවීම වැලැක්වෙන තත්ත්වයකින් තබා ගැනීම ද මදුරුවන් හා කෘමි සතුන් බෝවීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි කටයුතු කිරීමද කළ යුතුය.
   (iv) පරිශ්‍රය තුළ ඇති සියළුම ළිං යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් හා රෝගකාරක කෘමීන් බෝවීම වැළැක්වෙන තත්ත්වයෙන් තබා ගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය.
   (v) හිස් කිරීමට හැකිවන ආකාරයෙන් සාදා ඇති යම් කෘතිම පොකුණක් වේ නම් එය යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් හිස් කොට පවිත්‍ර කළ යුතුය.
   (vi) ගෙවතුවල හා ඉඩම් වල ඇති කාණුවලින් බැසයන ජලය එකතුවීමෙන් දිය කඩිති සෑදීම වැළැක්වීම සඳහා ඒවා නිතිපතා නඩත්තු කළ යුතුය.
   (vii) ආහාර පිණිස හෝ අලංකාරය සඳහා වවනු ලබන පැළැටි හැර අනෙකුත් සියලුම ලඳු කැලෑ, වගා සහ වෘක්ෂලතාදිය මනුෂ්‍ය වාසස්ථානයක් වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදිකිරීමක සිට මීටර් 5 ක් ඇතුළත වූ සෑම කොටසකින්ම ඉවත් කරනු ලැබිය යුතුය.
   (viii). සියලුම ගල් වලවල්, මැණික් ගැරු වලවල්, මැටි වලවල්, හෝ වෙනත් ඕනෑම කරුණක් සඳහා තනන ලද වලවල් ඒවායේ ජලය එකතුවීම වලක්වන ආකාරයට පවත්වාගෙන යා යුතුය.
   (vii) ජලය රැඳිය හැකි ගෙබිම වැවෙන විසිතුරු පැළැටි, දිය පරඬැල්, පෙඳපාසි, තෙල් පාසි, බරවා පාසි ඇතුළත් ජලජ පැළැටි මදුරුවන් හා කෘමීන් බෝවීමට ඉඩකඩ සලසන බව කලින් කල දැන ගන්නට ලැබෙන වෙනත් යම් පැළැටියක් හෝ පැළැටි ඉවත් කොට විනාශ කර දැමිය යුතු අතර, එකී පැළැටි යම් දිය මාර්ගයක් දිගේ පාවී යාම නවත්වන පරිදි සුදුසු බාධක ඉදිකිරීමෙන් ඒවා පැතිර යාම වළක්වාලිය යුතුය.

(x) වැසිකිළි, දියවලවල්, දිය උරන වලවල්, මුද්‍රා තැබූ වලවල් හා ඒවායේ වටපිටාවද ඇතුළුව ඒ ස්ථානයේ ඇති සියලු වැසිකිළි මදුරුවන් බෝවීම වළක්වන තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු ය.

xi. සුසාන භූමි හෝ වෙනත් පරිශ්‍රයන්හි මලවුන් සඳහා ඉදිකෙරෙන සිහිවටන ජලය නොරැඳෙන අයුරින් ඉදිකිරීමට කටයුතු කළ යුතු ය.

4. කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියෙකු විසින් හෝ ඕනෑම දිනයක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා ඇතුළත යම් වේලාවක දී යම් පරිශ්‍රයකට ඇතුල් වී පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස ඒ පරිශ්‍රය පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේ ය.

(i) ඒ පරිශ්‍රය මදුරුවන් හා කෘමීන් බෝවන පරිශ්‍රයක් ද යන වග;
(ii) ඒ පරිශ්‍රයේ පදිංචිකරු මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැද තිබේද යන වග;
(iii) ඒ පරිශ්‍රයේ මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සහ විනාශ කිරීම සඳහා යම් පියවර ගැනීමට අවශ්‍ය වේ නම්, එම පියවර කවරේද යන වග සහ;
(iv) ඒ පරිශ්‍රයේ කෘමි නාශක ඉසීම සාර්ථක ලෙස කර තිබේද, යන වග.

5.

(i) සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියෙකු විසින් යම් පරිශ්‍රයක අවශ්‍ය වේ යැයි සලකනු ලබන පරීක්ෂණයකින් පසු, එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝගකාරක කෘමීන් විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩ පැවැත්වීමට ඉටු කළ යුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් ඒ පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකිය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි ඡේදය යටතේ දැන්වීමක් භාරදෙන ලද යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ දී එකී නියමයන් ඉටු කරනු ලැබිය යුතු ය.

6.

(i) සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු, එහි යම් ළිඳක් තැනීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක්, වතුර මලක් හෝ වතුර එක්රැස් විය හැකි හෝ වතුර රඳවා තබන වෙනත් ව්‍යුහයක් ඉදිකිරීම නොකළ යුතු ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි ඡේදයේ සඳහන් විධිවිධානවලට පටහැනි වන සේ යම් ඉදිකිරීමක් කරනු ලැබූ අවස්ථාවක, සභාපතිවරයා විසින් එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලයක් තුළ දී එකී ළිඳ, ටැංකිය, පොකුණ, ජල භාජනය වතුර මල හෝ ව්‍යුහය නියම කරනු ලබන ද්‍රව්‍යයකින් පුරවා වසා දමන ලෙස හෝ අන්‍යාකාරයකින් විනාශ කරන දමන ලෙස නැතහොත්, ඒ කාලය ඇතුළත ඒ දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයට එය වෙනස් කරන ලෙස නියම කළ හැකි ය.

7.

(i) 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ වූ දැන්වීමක් යම් පරිශ්‍රයක අයිතිකරුට හෝ පදිංචිකරුට පෞද්ගලිකව භාරදීම හෝ එම දැන්වීම එකී ස්ථානයේ හොඳින් පෙනෙන තැනක ඇලවීමෙන් හෝ භාරදෙනු ලැබිය හැකිය.

(ii) යම් පරිශ්‍රයක හවුල් අයිතිකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් හවුලේ අධිවසනය කරන අවස්ථාවක එම අයිතිකරුවන්ගෙන් එක් එක් අයිතිකරුවෙකු 7(i) වැනි අතුරු ව්‍යවස්ථාව හා 5 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඔවුන් අතරින් යම් අයෙකුට භාරදෙනු ලබන යම් දැන්වීමක නියමයන් ඉටුකිරීම සම්බන්ධ යම් පැහැර හැරීමකට හෝ ඉටු නොකර සිටීමකට පොදුවේ සහ වෙන් වෙන්ව වගකිව යුතු ය.

(iii) 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ කිසියම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ ඒ දැන්වීමේ සඳහන් නියමයන් ඉටු කිරීම පැහැර හරින ලද අවස්ථාවක, සභාපතිවරයා විසින් හෝ ඒ දැන්වීම නිකුත් කරන ලද නිලධාරියා විසින් හෝ තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් යම් නිලධාරියෙකු විසින් ඕනෑම දිනයක පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා අතර වේලාවක අවශ්‍ය විය හැකි සහායකයින් සහ සේවකයින් සමග එකී පරිශ්‍රයට ඇතුළු වී ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරවීම හෝ ක්‍රියාත්මක කරවීමට සැළැස්වීම කරනු ලැබිය හැකි ය.

(iv) යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ භාරදෙන ලද දැන්වීමක නිශ්චිතව සඳහන් කර ඇති යම් කාර්යයක් හෝ කාර්යයන් සභාපතිවරයා විසින් හෝ බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කළ විට හෝ ඉටු කළ විට ඒ කාර්යය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහිලා ප්‍රාදේශීය සභාවට දරන්නට සිදුවූ වියදම් ප්‍රමාණය, එකී ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු ය.

සභාපතිවරයා විසින් සිය අත්සන යටතේ ඒ පිළිබඳව ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු දින 14 ක් ඇතුළත ඒ මුදල එකී අයිතිකරු හෝ පදිංචිකරු විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු අතර නිශ්චිත කාලය තුළ එකී මුදල ගෙවනු නොලැබුවහොත් ප්‍රාදේශීය සභා පනතේ VIII වැනි කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේ ය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල -

"අයිතිකරු" යන්නෙන් යම් අයිතිකරුවෙකු සහ බදුකරුවෙක් ද යම් පරිශ්‍රයක කුලියට හෝ එළදාවට කවර හෝ ආකාරයක අයිතියට හිමිකම් ඇති යම් තැනැත්තෙකු,

"පදිංචිකරු" යන්නෙන් යම් යම් පරිශ්‍රයක පදිංචිව සිටින්නා වූ හෝ තවත් අයෙකුගේ නියෝජිතයෙකු වශයෙන් හෝ එහි භාරකාරීත්වය, කළමනාකරණය හෝ පාලනය සිදු කරනු ලබන තැනැත්තෙකු ද,

"පරිශ්‍රය" යන්නෙන් යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක්, හෝ ඉදිකිරීමක්, පාවිච්චි කරනු ලබන හෝ අත්හැර දමන ලද ළිඳක්, නැවක්, හෝ කන්ටේනරයක් හෝ අතහැර දමන ලද වාහනයක් ඇතුළත් වන අතර යම් පොකුණක්, ටැංකියක්, වැවක්, ජල මාර්ගයක කාණුවක් හා ගංගා නිම්නය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ එම සභාවේ යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු ද,

"රෝගකාරක කෘමීන්" යන්නෙන් මදුරුවන් හෝ රෝග බෝ කරන වෙනත් කෘමීන් ද,

"සභාපති" යන්නෙන් කුරුවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,
"සභාව" යන්නෙන් කුරුවිට ප්‍රාදේශීය සභාව ද අදහස් වේ.

06-320

---

# විවිධ දැන්වීම්

**බණ්ඩාරවෙල මහ නගර සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

**XX වැනි කොටස - වෙළඳපළවල් සහ ඉස්තාල, කරත්ත ගාල්, ගවයින් සඳහා අංගන ආදිය තබා ගැනීම සඳහා බලපත්‍ර**

***අංක 09 දරන අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම***

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ඉහත කී 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් පිළිගන්නා ලද එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මාලාවේ XX වැනි කොටස - "වෙළඳපළවල් සහ ඉස්තාල, කරත්ත ගාල්, ගවයින් සඳහා අංගන ආදිය තබා ගැනීම" සඳහාවූ, බලපත්‍ර යටතේ දැක්වෙන අංක 09 දරන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විශේෂ බලපත්‍ර ලබා ගත යුතු මස් මාංශ වර්ගවලට අමතරව, මෙම මහා නගර සභාව විසින් සපයා ඇති පොදු වෙළඳපොළක හැර, මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත කිසිම ස්ථානයක හෝ වීදියක සභාවේ විශේෂ බලපත්‍රයක් නොලබා, "තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් එළවළු විකිණීම හෝ විකිණීම පිණිස ප්‍රදර්ශනය කිරීම ද හෝ එහා මෙහා ගෙන යාම ද" නොකළ යුතු බවට 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ අංක 267 (1) උපවගන්තිය ප්‍රකාරව සංශෝධනය කොට ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට 2012.09.26 වැනි දින මෙම මහ නගර සභාවේ පැවති විශේෂ සභා රැස්වීමේ අංක 05 (III) දරන සභා තීරණය පරිදි තීරණය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. එම්. ජේ. හේරත්,
නාගරික කොමසාරිස් (වැ.බ.),
බණ්ඩාරවෙල මහා නගර සභාව.

2012 ඔක්තෝබර් මස 11 වැනි දින,
බණ්ඩාරවෙල මහ නගර සභා කාර්යාලයේ දී ය.

06-327/1

### බණ්ඩාරවෙල මහ නගර සභාව

ව්‍යාපාර සහ වෘත්තීන් පිළිබඳ බදු පැනවීම- 2013 වර්ෂය

උක්ත හිසින් යුතුව ම විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අංක 1789 දරන 2012 මස දෙසැම්බර් 14 වැනි සිකුරාදා IV (ආ) වැනි පළාත් පාලන කොටසේ පළ කරන ලද බණ්ඩාරවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර සහ වෘත්තීන් පිළිබඳ බදු පැනවීම සම්බන්ධව පළ කර ඇති දැන්වීමෙහි උප ලේඛනය 01 කොටසේ සඳහන් ව්‍යාපාර හා වෘත්තීන් වලට අමතරව පහත සඳහන් උපලේඛනයේ සඳහන් ව්‍යාපාර සඳහාද 2013 වර්ෂය වෙනුවෙන් බදු පනවා අය කිරීමට බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් තීරණය කරන ලද බැව් මෙයින් දැනුම් දෙමි.

එච්. එම්. ජේ. හේරත්,<br>
නාගරික කොමසාරිස් (වැ. බ.),<br>
බණ්ඩාරවෙල මහ නගර සභාව.

2012 නොවැම්බර් මස 20 වැනි දින,<br>
බණ්ඩාරවෙල මහ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛන 01 කොටස**

*වෘත්තීන් හෝ වෙළඳ ව්‍යාපාර :*

01. සංචාරක ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

06-327/2

---

### බණ්ඩාරවෙල මහ නගර සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අය කිරීම

252 වැනි අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 247 ඈ (1) උපවගන්තිය පරිදි මහ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බණ්ඩාරවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ සංවර්ධන නොකළ ඉඩම් වල තක්සේරු වටිනාකමින් 2% ක් වූ වාර්ෂික බද්දක් 2013 අප්‍රේල් මස 01 වැනි දින සිට පනවා අය කිරීම සුදුසු බවට බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් තීරණය කරන ලද බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

තවද මෙම බද්ද 2013 වර්ෂයේ සිට ඉදිරියට සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට පෙර අදාළ ඉඩම් හිමිකරුවන් විසින් බණ්ඩාරවෙල මහ නගර සභාව වෙත ගෙවිය යුතු බවද දැනුම් දෙනු ලැබේ.

එච්. එම්. ජේ. හේරත්,<br>
නාගරික කොමසාරිස් (වැ.බ.),<br>
බණ්ඩාරවෙල මහ නගර සභාව.

2013 අප්‍රේල් මස 01 වැනි දින,<br>
බණ්ඩාරවෙල,<br>
මහ නගග සභා කාර්යාලයේ දී ය.

06-327/3

---

### බණ්ඩාරවෙල මහ නගර සභාව

වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අයකිරීම -<br>
2013 වර්ෂය

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ඉහත කී 2 වැනි වගන්තියේ 3 වැනි උපලේඛනයේ විධිවිධානවලට යටත්ව බණ්ඩාරවෙල මහ නගර සභාව විසින්ද පිළිගන්නා ලද එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක XVIII වැනි කොටසේ II වැනි කාණ්ඩයේ 9(අ) අතුරු ව්‍යවස්ථාවට අදාළව උපලේඛනයේ දැක්වෙන ගාස්තු ප්‍රමාණයන් පහත උපලේඛනයේ විස්තර වන පරිදි සංශෝධනය කිරීමටත්, ඒ අනුව 2013.05.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ ගාස්තු අය කිරීම සුදුසු බවටත්, බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් තීරණය කරන ලද බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. එම්. ජේ. හේරත්,<br>
නාගරික කොමසාරිස්,<br>
බණ්ඩාරවෙල මහ නගර සභාව.

2013 අප්‍රේල් මස 26 වැනි දින,<br>
බණ්ඩාරවෙල මහ නගර සභාවේ දී ය.

### උපලේඛනය

බණ්ඩාරවෙල ධර්මවිජය මාවතට යාබද ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථානය ඉදිරිපස පිහිටි රථගාල තුළ නවතා තබනු ලබන සියලුම මෝටර් රථ වාහන වෙනුවෙන් පැය 01 ක් හෝ ඉන් කොටසක් වෙනුවෙන් අය කළ යුතු ගාස්තුව - රුපියල් පනහකි. (රු. 50.00)

06-327/5

---

## බණ්ඩාරවෙල මහ නගර සභාව

### ජල සම්පාදනය සම්බන්ධව අතුරු ව්‍යවස්ථා යටතේ දැන්වීම

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1989.01.20 වැනි දින අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටසේ ප්‍රසිද්ධ කරන ලද්දා වූ සම්මත අතුරු ව්‍යවස්ථා මාලාව බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් ද පිළිගත්තා ලදුව එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ IV කොටසේ 32 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තු පැනවීම පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කොට 2013.05.01 වැනි දින සිට අය කිරීම සුදුසු බවට බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. එම්. ජේ. හේරත්,
නාගරික කොමසාරිස්,
බණ්ඩාරවෙල මහ නගර සභාව.

2013 අප්‍රේල් මස 30 වැනි දින,
බණ්ඩාරවෙල මහ නගර සභා කාර්යාලයේ දී ය .

### උපලේඛනය

32(ආ) මහ නගර සභා බල ප්‍රදේශය තුළ ජල මාපකයක් මගින් ගෘහ කාර්ය සඳහා ජලය සැපයෙන අවස්ථාවක දී ඒ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් මසකට ගෙවිය යුතු වන ගාස්තු පහත සඳහන් පරිදි විය යුතු යි :-

(i) ගෘහස්ථ කාර්යයන් සඳහා සභා සීමාව ඇතුළත සංශෝධිත ජල ගාස්තු

| *ඒකක* | *මුදල රු. ශත* |
|---|---|
| 01-05 | 16 0 |
| 06-10 | 25 0 |
| 11-15 | 30 0 |
| 16-20 | 40 0 |
| 21-25 | 58 0 |
| 26-30 | 70 0 |
| 31.40 | 80 0 |
| 41-50 | 100 0 |
| 51 සිට ඉහළට | 125 0 |

මීට අමතරව සේවා ගාස්තු වශයෙන් රුපියල් 200 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

ii. මහ නගර සභා බල ප්‍රදේශයෙන් පිට ජල මාපකයක් මගින් ගෘහ කාර්ය සඳහා ජලය සැපයෙන අවස්ථාවක දී ඒ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් මසකට ගෙවිය යුතු වන ගාස්තු පහත සඳහන් පරිදි විය යුතු ය :-

| *ඒකක* | *මුදල රු ශත* |
|---|---|
| 01-05 | 20 0 |
| 06-10 | 30 0 |
| 11-15 | 40 0 |
| 16-20 | 50 0 |
| 21-25 | 58 0 |
| 26-30 | 70 0 |
| 31-40 | 80 0 |
| 41-50 | 100 0 |
| 51 සිට ඉහළට | 125 0 |

මීට අමතරව සේවා ගාස්තු වශයෙන් රුපියල් 400 0ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(iii) සීමාවෙන් පිට ජල ගාස්තු (ගෘහ සේවාවන්ට අමතරව සෑම ආයතනයකින් අය කිරීම සඳහා)

| *ඒකක* | *මුදල* |
| --- | --- |
| | *රු ශත* |
| 1-25 | 75 0 |
| 26-50 | 100 0 |
| 51-75 දක්වා | 125 0 |
| 76 සිට ඉහළට | 140 0 |

මීට අමතරව සේවා ගාස්තු වශයෙන් රුපියල් 500.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(vi) රජයේ පාසල් සඳහා ජල ගාස්තු

| *ඒකක* | *මුදල* |
| --- | --- |
| | *රු ශත* |
| 1-30 | 20 0 |
| 31 සිට ඉහළට | 25 0 |

මීට අමතරව සේවා ගාස්තු වශයෙන් රුපියල් 20.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(v) ආගමික ස්ථාන සඳහා ජල ගාස්තු

| *ඒකක* | *මුදල* |
| --- | --- |
| | *රු ශත* |
| 1-30 | 15. 0 |
| 31 සිට ඉහළට | 25 0 |

මහා නගර සභා බල ප්‍රදේශය තුල ආගමික ආයතනවල, වන්දනාමාන ස්ථාන වලින් ඉහත සඳහන් ගාස්තුවට අමතරව සේවා ගාස්තු වශයෙන් රුපියල් 200.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(vi) රජයේ පාසල් වල පවත්වාගෙන යන නේවාසිකාගාරය සඳහා

| ඒකක | මුදල |
| --- | --- |
| | *රු ශත* |
| 1-10 | 60 0 |
| 11-20 | 70 0 |
| 21-30 | 80 0 |
| 31-40 | 100 0 |
| 41සිට ඉහළට | 125 0 |

මීට අමතරව සේවා ගාස්තු වශයෙන් රුපියල් 400.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(vii) ආගමික ස්ථාන නොවන මුදල් උපයන ස්ථාන සඳහා ජල ගාස්තු

| *ඒකක* | *මුදල* |
| --- | --- |
| | *රු ශත* |
| 1-10 | 60 0 |
| 11-20 | 70. 0 |
| 21-30 | 80. 0 |
| 31-40 | 100 0 |
| 41 සිට ඉහළට | 125 0 |

මීට අමතරව සේවා ගාස්තු වශයෙන් රුපියල් 200.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(viii). රජයේ පාසල් හැර මුදල් අය කරන පාසල් සහ මුදල් මාසිකව අය කරන පෙරපාසල් සඳහා

| *ඒකක* | *මුදල* |
| --- | --- |
| | *රු ශත* |
| 1-10 | 60 0 |
| 11-20 | 70 0 |
| 21-30 | 80 0 |
| 31-40 | 100 0 |
| 41 සිට ඉහළට | 125 0 |

මීට අමතරව සේවා ගාස්තු වශයෙන් රුපියල් 350 ක මුදලක් අය කරනු ලැබේ.

(ix) සාමාන්‍ය හෝටල්, තානායම්, ලැගුම්හල්, වෙළෙඳ ආයතන, පෞද්ගලික පන්ති පැවැත්වෙන ස්ථාන සහ ඉදිකිරීම් ඃ

| *ඒකක* | *මුදල* |
|---|---|
| | *රු ශත* |
| 1-10 | 60 0 |
| 11-20 | 70 0 |
| 21-30 | 80 0 |
| 31-40 | 100 0 |
| 41 සිට ඉහළට | 125 0 |

මීට අමතරව සේවා ගාස්තු වශයෙන් රුපියල් 400 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(x) සංශෝධිත ජල ගාස්තු ඃ- සංචාරක හෝටල්, රජයේ හෝටල්, රජයේ ආයතන සහ ඉදිකිරීම් ඃ

| *ඒකක* | *මුදල* |
|---|---|
| | *රු ශත* |
| 1-25 | 75 0 |
| 26-50 | 100 0 |
| 51-75 දක්වා | 125 0 |
| 76 සිට ඉහළට | 140 0 |

මීට අමතරව සේවා ගාස්තු වශයෙන් රු. 1,500 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

මහ නගර සභා සීමාවෙන් පිටත ඉහත ගණයට වැටෙන ව්‍යාපාරික ස්ථානයක් හෝ නේවාසිකාගාරයක් පවත්වා ගෙන යනු ලබන විට ගාස්තු ක්‍රමයේ වෙනසක් ඇති නොවන අතර මාසික ස්ථාවර සේවා ගාස්තුව රු. 500 ක් වේ.

| | *රු. ශ.* |
|---|---|
| ජලය සමග බවුසරය සහ ට්‍රැක්ටර් මැෂිම ප්‍රවාහන ගාස්තු සමග | 1,500 0 |
| ටාටා ජල බවුසරය ජලය හා ප්‍රවාහනය සමග | 2,500 0 |

මහ නගර සභා සීමාවන් තුළ ඉහත ගාස්තු අය කරනු ලබන අතර, මහ නගර සභා සීමාවෙන් පිටත ආරම්භ වන පළමු කිලෝමීටරය සඳහා ලොරියට රු. 220 ක් හා අතිරේක සෑම කිලෝමීටරයකටම රු. 120 ක් වන අතිරේක ගාස්තුවක් අය කරනු ලැබේ.

ට්‍රැක්ටර් රථයෙන් ජලය ලබා ගන්නේ නම් සෑම එක් කිලෝමීටරයකටම රු. 100 ක ගාස්තුවක් අය කරනු ලැබේ.

ඉහත සඳහන් සියළු ගාස්තුවලට අමතරව රජය විසින් වරින් වර පනවා අය කරනු ලබන බදු මුදල් අය කරනු ලැබේ.

ජල මාපකයක් ක්‍රියාවිරහිත වූ විට හෝ අලුත්වැඩියා කටයුතු හෝ අංක සංශෝධනය සඳහා එය ඉවත් කළ විට ජල පරිභෝජනය සටහන් කර ගැනීම සඳහා ජල මාපකය නොමැති කාල සීමාව තුළ සිදුකරන ජල පරිභෝජනය ජල මාපකය ඉවත් කිරීමට හෝ ජල මාපකයේ දෝෂ ඇතිවීමට පෙර ආසන්නයේ අනු පිළිවෙලින් පැවති යම් ජල මනු කියවීම් දෙකකදී ලබා ගත් දෛනික ජල පරිභෝජනයේ සාමාන්‍ය ගණන අනුව ගණන් බලනු ලැබේ.

*විවිධ ගාස්තු සහ කොන්දේසි -*

නව සේවා සම්බන්ධතා - නව සේවා සම්බන්ධතාවයක් ලබාදීමේදී දරනු ලබන පිරිවැය පාරිභෝගිකයාගෙන් අයකරනු ලැබේ.

ආපසු ගෙවන රු. 2,000 ක් එක්වර අය කිරීම් මුදලක් පාරිභෝගිකයා විසින් සභාව වෙත ගෙවිය යුතුය.

මාස තුනකට වඩා පැරණි ජල බිල්පත් ගෙවීමේ දී බිල්පතේ සඳහන් ගාස්තුවට අමතරව 10%ක දඩ මුදලක් අය කරනු ලැබේ.
විසංධි කරනු ලබන සෑම ජල සම්බන්ධතාවයකම නැවත පිරිද්දුම් ගාස්තු සඳහා රු. 1000 ක මුදලක් රජයෙන් අනුමත බදු සමග අය කරනු ලැබේ.

සියලු ගාස්තු සඳහා රජයෙන් අනුමත බදු අය කරනු ලැබේ.

06-327/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.